# තනි පද - 10

***වචන කිහිපයක් වෙනුවට යෙදිය හැකි තනි වචන තනි පද නම් වේ***

*උදා :-* අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

1) උසාවියෙන් වරදකරුවන් වූවන් එල්ලා මරාදමන තැනැත්තා - අලුගෝසුවා
2) බැගෑපත්ව කරන ඉල්ලීම - ආයාචනය
3) නගරයට අධිපති - නගරාධිපති
4) දුටුවන් බියට පත් කරන - බියකරු
5) ඇළකින් එගොඩ වීමට ඇති ලීය - ඒදණ්ඩ
6) විදුහලක ප්‍රධානියා - විදුහල්පති
7) බලයට ඉතා කැමති - බලකාමී
8) පාරවල් තුනක් එකට එකතු වන තැන - තුන්මංසල
9) පාරවල් හතරක් එකට එකතු වන තැන - සිව්මංසල
10) සඟවා ඇති රන්රිදී මුතු මැණික් ආදී වස්තුව - නිධානය
11) මිතුරන්ට විරුද්ධව ක්‍රියාකරන - මිත්‍රද්‍රෝහී
12) රජයට විරුද්ධව ක්‍රියාකරන - රාජද්‍රෝහී
13) වේගයෙන් හමන සුළඟ - සුළි සුළඟ
14) කලාවට ලැදි - කලාකාමී
15) දැව දඬුවලින් භාණ්ඩ සාදන තැනැත්තා - වඩුවා
16) එකම කාලය තුළ පැවති - සමකාලීන
17) අවවාද දෙන තැනැත්තා - අනුශාසක
18) ගසක ඵල නොලබන කාලය - අවාරය
19) ගඟක් මුහුදට වැටෙන ස්ථානය - මෝය
20) තමා සතු දේ දීමට අකැමති - මසුරු